දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය - රුහුණ විශ්වවිද්‍යාලය
DISTANCE AND CONTINUING EDUCATION UNIT – UNIVERSITY OF RUHUNA

සාමාන්‍ය ශාස්ත්‍රවේදී උපාධි ප්‍රථම භාග (බාහිර) පරීක්ෂණය - 2014 පෙබරවාරි/මාර්තු
Bachelor of Arts Degree (External) Part I Examination - February/March 2014

# සිංසා 2.1 - සම්භාව්‍ය සිංහල පද්‍ය කාව්‍යය හා ව්‍යාකරණ සම්ප්‍රදාය
# SLG 2.1 - Classical Sinhala Poetry and the Grammatical Tradition

කාලය පැය තුන යි

පළමු වන කොටසට හා II, III කොටස්වලින් ප්‍රශ්න දෙක බැගින් තෝරාගෙන,
ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.
(නොපැහැදිලි අත් අකුරුවලට ලකුණු අඩු කරනු ලැබේ.)

---

## I කොටස

01. පහත දැක්වෙන පද්‍යවල අර්ථ ලිහිල් බසින් ලියන්න.

(අ) පමා ලිය කුමුදු හර පොකුරුකුරු නෙත් මින්
මිහි කළ පියුම් හල් විල් බිජී මීලොල් රජහස්

පිළිබිඹු නෙතුපුලොත නරනිඳු ලැදි පියක දූන්
මිහිවිතැ සෙහෙස් දිස්නා උවනත මත් කෙළෙ පටන්

නැත ද සෙස් පිළිමිණි විත් කතක මිහිමත්
නඟා දෙත සිනෙ රජ රජ ලද බිසෙව් සිරි හා ·

(කව්සිළුමිණ, ඇම්.බී. ආරියපාල සංස්.)

(ආ) සවන සතිය වැසි වසිනා දස දිගෙහි
පෙණින සෙවෙනි මුදලිඳු නා දරණ ගෙහි
සවන හිඳිනු දන නඳනා නෙතු යුගෙහි
වඳන මැනවි පිළිමය නා පිළිම ගෙහි

සසරින් මුදා ලෙව් සදහම් අමාදී
එකඟින් මුනිඳු හුන් වැනි නිපුරමාදී
ලකුණින් සපිරි පිළිමය දැක සමාදී
වැඳගත් මිතුර තුන් සිත කැරැ සමාදී

(සැළලිහිණි සන්දේශය, සූචරිත ගම්ලත්, සංස්)

(ඇ) පිපි සමන් කුසුමන් පටින් තන රන් හසුන් මන් මෙන් බැඳේ
ලඹ සවන් දිගු රන් පසින් දන නෙත් මුවන් බඳිමින් තදේ
මඳ පවන් වැද ලෙළ පහන් සිළු මෙන් රැගුම් දෙන රන් බඳේ
දිලි ඔවුන් රූ සිරි නුවන් වන් බඹ වුවත් දැහැනින් මිදේ

පෑ උදුල් සිතියම් ලෙසින් සිටිනේ සුරන් සහ සක් නුබේ
රූ නිමල් සුරලිය තොසින් බැසැ රඟ කෙරෙත් නර රජ සබේ
මීරි කල් තත් සුන් වෙණින් බෝසත් ඔවුන් කරවයි ලොබේ
මේ සියල් විසිතුරු උතුම් එක තැනැ දැකුම් කිකලෙක ලැබේ

(ගුත්තිල කාව්‍යය, ඩබ්.එෆ්. ගුණවර්ධන සංස්.)

(ඇ) නැණැති දනන්හට මඳ ගුණයක් කළ ද
පවති ගල කෙටූ අකුරක් මෙන් නිබ ද
විමති දනන්හට කළ කිසි ගුණ නොම ද
එනැති වේය දිය පිට ඇඳි ඉරක් ලෙ ද

උතුම් නිවන් සැප සපයා දෙන මහත
දහම් රජ සමය නො ගතිති කුදිටු සත
නොහිමි සුවඳ විහිදෙන සිරි රැඳි දිමුත
පියුම් විලෙහි නිල මැසි කැල නො හැසිරෙත

(සුභාෂිතය - සුචරිත ගම්ලත් සංස්.)

(ලකුණු 28 යි)

## II කොටස

02. අවස්ථෝචිත වර්ණනයෙහි ලා කව්සිළුමිණ කවියාගේ සාමාර්ථ්‍යය කෙබඳු දැ යි ඔබට අභිමත වැනුමක් ඇසුරෙන් සනිදර්ශන ව පහදන්න.

03. "අර්ථ රසය ඔප් නංවන ශබ්ද මාධුර්යය සැළලිහිණි සන්දේශයේ විශිෂ්ට කාව්‍ය ගුණයකි" නිදසුන් සහිත ව විමසන්න.

04. "ගුත්තිල කවියා ජාතක මූලාශ්‍රයෙහි එන වැදගත් සිද්ධි තෝරා ගෙන, ඒවායින් අපූර්ව කාව්‍යෝක්ති නැංවීමට සමත් විය" සහේතුක ව විමසන්න.

05. සදුපදේශ සමාජ ප්‍රගමනය උදෙසා ඉවහල් වන්නේ කෙසේ දැ යි සුභාෂිතය ඇසුරෙන් සනිදර්ශන ව පහදන්න.

## III කොටස

06. සිදත් සඟරාවේ දැක්වෙන 'ශුද්ධ සිංහල හෝඩිය' වර්තමාන සිංහල ලේඛන ව්‍යවහාරය සඳහා ප්‍රමාණවත් නො වන්නේ මන්දැ'යි සනිදර්ශන ව පහදන්න.

07. "දයින් නමින් හොත කරනුයේ පස නම්" සිංහල භාෂාවේ ප්‍රත්‍ය භාවිතය පිළිබඳ ව සිදත් සඟරාවේ එන මේ විග්‍රහය නිදසුන් සහිත ව පැහැදිලි කරන්න.

08. සමාස යනු කුමක් දැ යි හඳුන්වා, විශේෂණ සමාසය පිළිබඳ විග්‍රහයක් කරන්න.

09. පහත දැක්වෙන මාතෘකා අතුරෙන් තුනකට ලුහුඬු විවරණ සපයන්න.

(i) හකර විනිස
(ii) ආශිර්වාද ක්‍රියා
(iii) ලෝප සන්ධි
(iv) කර්ම විභක්ති ප්‍රයෝග
(v) දා පියෙවි (ධාතු ප්‍රකෘති)

(02 - 09 ප්‍රශ්නවලට ලකුණු 18 බැගිනි)

*************************